www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආන්ඩුවේ හා විපක්ෂයේ දේශපාලන උපාමාරු ආඥාදායකත්වයක් ඇටවීම සඳහායි

සමන් ගුනදාස විසිනි

2018 පෙබරවාරි 21

පලාත්පාලන මැතිවරනයෙන් ලද පරාජයන් නිසා කොකොටාගැනීම්වල යෙදී සිටි ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන හා අගමැති රනිල් වික්‍රමසිංහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයත් (එජනිස) එක්සත් ජාතික පක්ෂයත් (එජාප) අතර ජාතික සමගි ආන්ඩුව දිගටම ගෙන යාමට එකගවූ බව වාර්තාවිය.

මැතිවරනයට පසු පෙබරවාරි 11 දා පටන් ගතවූ දින 10 තුල හවුල් ආන්ඩුවේ හා විපක්ෂයේ දේශපාලන පක්ෂ අලුතින් පෙලගැසීම් ඇති කරගෙන අලුත් ආන්ඩුවක් සෑදීම සඳහා වියරු සහගත උපාමාරු වල යෙදුනේය. මේ සියල්ලට ඉහලින් ඇමරිකාවේ හා ඉන්දියාවේ තානාපතීන් සිරිසේන හා වික්‍රමසිංහ වෙනවෙනම හමුවී ආන්ඩුව දිගටම ගෙනයන ලෙසට අවවාද කර ඇත. ආන්ඩුව දෙදරවමින් සිදුවූ මෙම උපාමාරුවලින් පෙන්නුම් කෙරෙන්නේ ලංකාවේ පාලක පන්තියේ ඉහවහා ගිය අර්බුදය මෙන්ම මෙම පක්ෂ මහජනයා ගැන මොනම තැකීමක්වත් නැති, ඔවුන්ට එරෙහිව පවත්නා සංවිධාන බවය.

පලාත්පාලන මැතිවරනයේ දී එජාප හා ශ්‍රීලනිප-එජනිස ජන්ද පිලිවෙලින් සියයට 33 හා සියයට 14 දක්වා වැටුනු අතර ඒවාට හිමි වුයේ පලාත්පාලන ආයතන 41ක් සහ 10කි. ආන්ඩුවේ පක්ෂවලට විරුද්ධව තරග කල ශ්‍රී ලංකා පොදුජන පෙරමුන (ශ්‍රීලංපොපෙ) ආයතන 329ක් හා ප්‍රකාශිත ජන්දවලින් සියයට 45 ක් ලබා ගත්තේය.

තෙවසරකට පෙර අපකීර්තියට පත්ව පරාජයවූ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ නායකත්වය දුන් ශ්‍රීලංපොපෙට මහ ජනයා ජන්දය දුන්නේ ඔහු ප්‍රමුඛ කන්ඩායම කෙරෙහි පැහැදීමක් නිසා නොවේ; ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් තහවුරු කිරීම, ජීවන කොන්දේසි ඉහල දැමීම හා යුද්ධයේ විනාශයන්ට ගොදුරුවූ දෙමල ජනයාගේ අයිතීන් ලබාදීම ඇතුලු පොරොන්දු දී බලයට පත්වූ සිරිසේන-වික්‍රමසිංහ ආන්ඩුව එම පොරොන්දු බිඳ දැමීම ගැන විරුද්ධත්වය පල කිරීම සඳහා ය.

එජාපය බහුතරය නියෝජනය කල ආන්ඩුවේ ප්‍රහාරවලට තමන් වග නොකියන බවට ද දූෂන හා සෝලිවලින් කුනුවූ කොටස් සමග මොනම සම්බන්ධයක්වත් තබා නොගන්නා බවට ද මැතිවරන ව්‍යාපාරය තුල දී වහසිබස් දෙඩූ සිරිසේන පරාජයන් ගෙන් පසු එහි වගකීම වික්‍රමසිංහ මත පටවමින් අලුත් ආන්ඩුවක් පිහිටුවීමේ ඉඩ ගැන ගනන් බැලුවේය. වික්‍රමසිංහ අගමැතිකමින් අස් විය යුතු යැයි කියා සිටි නමුත් සිරිසේන ඔහු සමග පසුගිය දින දහය තුල අඩු ගනනේ සාකාච්ජා වට හතරක් පවත්වමින් ඊලග ආන්ඩුව කුමක් විය යුතු දැයි විමර්ශනය කලේ ය.

ඒ අතරම ශ්‍රීලනිප-එජනිස ආන්ඩුවක් සෑදීමේ හැකියාව සලකා බැලීමට ජනාධිපති තමන්ගේ සතුරෙකු ලෙස සැලකූ රාජපක්ෂට ද ඔහුගේ කන්ඩායමටද අත දික් කලේ ය. රාජපක්ෂට කෙලින්ම කතා කිරීමට උත්සාහ කල ඔහු ශ්‍රීලංපොපෙ නායකයන් හමුවී "තනි ශ්‍රීලනිප ආන්ඩුවක්" හැදීමේ සැලසුම් ගැන කතා කිරීමට සුසිල් ප්‍රේමජයන්ත හා මහින්ද අමරවීර යන ඇමතියන් යැවුවේය.

ආන්ඩුවේ ප්‍රහාරවලින් දුරස්ත වීමට සිරිසේන දරන තැත කුහක ය. ඔහු වික්‍රමසිංහ සමග හවුලේ එම ප්‍රහාරවලට නායකත්වය දුන්නේ ය.

වික්‍රමසිංහ තමන්ගේ පැත්තෙන්, සිරිසේන නම්මා ගැනීමට තැත් කරන අතර ඔහුගේ එජාප නායකයන් ශ්‍රීලනිප මන්ත්‍රීන් බාගැනීමේ යටිකුට්ටු වැඩවල යෙදුනු බව වාර්තා විය.

මහා ජයග්‍රාහකයෙක් ලෙස ජනමාධ්‍ය හා හිතවාදීන් විසින් පුම්බන ලද රාජපක්ෂ ඉදිරියට පැන්නේ ආන්ඩුව විසුරුවා හැර මහා මැතිවරනයක් පැවැත්විය යුතු යයි ඉල්ලා සිටිමිනි. "රටතුල අස්ථාවර තත්වය නැති කිරීමට ස්ථාවර ආන්ඩුවක්" ඕනා බව ඔහු කිවේය. එහෙත් ඇමරිකානු හා ඉන්දියානු තානාපතියන් වික්‍රමසිංහ හා සිරිසේන හමුවී ආන්ඩුව දිගටම ගෙනයන ලෙස අවවාද කිරීමෙන් පසු එය තමන්ට ද නිකුත් කෙරුනු පනිවිඩයක් බව වටහා ගත් රාජපක්ෂ උද්ඝෝෂනයේ සැර බාලකරමින් තනි ශ්‍රීලනිප ආන්ඩුවක් සෑදීමට සිරිසේනට සහාය දෙන බව ප්‍රකාශ කලේ ය. ඔහු කතා කරන ස්ථාවර පාලනය නම් පොලිස් පාලනයක් රට තුල ඇටවීමයි.

ජනමාධ්‍යවලට ලබා දුන් සීමිත තොරතුරුවලට එහා මේ පක්ෂ නායකයන් කතා කලේ කුමක් දැයි මහජනයා නොදනිති. සිරිසේන හා වික්‍රමසිංහ හමුවී ඇමරිකානු හා ඉන්දියානු තානාපතියන් මාධ්‍යවලට හෙලිවූ

තොරතුරුවලට අමතරව කතා කලේ කුමක් දැයි ඔවුහු නොදනිති. මහජනයාගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ගැන මොනම තැකීමක් වත් නැති මේ පක්ෂ, අතලොස්සක් පාලක ප්‍රභූවේ හා අධිරාජ්‍යවාදී බලයන්ගේ උවමනාකම් මත ක්‍රියාකරන සංවිධාන වෙති.

ඇමරිකානු හා ඉන්දියානු රාජ්‍ය තාන්ත්‍රිකයන් මැදිහත්වූයේ, 2015 ජනාධිපතිවරනයේදී චීනයට සමීපව සිටි රාජපක්ෂ ඉවත්කර තන්ත්‍ර මාරු මෙහෙයුමකින් බලයට ගෙන ආ සිරිසේන හා ආන්ඩුව බලයේ තබා ගැනීමටයි. එය සිදු කෙරුනේ රාජපක්ෂ පාලනය කෙරහි පැවති මහජන විරෝධය ගසාකමින් මැතිවරනයක් තුලිනි. ලංකාව ඇමරිකානු අධිරාජ්‍යවාදීන් විසින් චීනයට එරෙහිව සූදානම් කෙරෙන මිලිටරි මූලෝපායික ජාලය තුලට ලංකාව සම්බන්ධ කිරීම මෙම මෙහෙයුමේ අරමුන විය. ආන්ඩුව බලයට ආ විගස ඇමරිකාවට හා ඉන්දියාවට පක්ෂව විදේශ ප්‍රතිපත්තිය වෙනස් කෙරුනි. එම මූලෝපායික අත්පත්කර ගැනීම නැති කරගැනීමට මේ රටවල් දෙක සූදානම් නැත.

මැතිවරනය පැවැත්වුනේ පන්ති අරගල නැගීඑන තත්වයක ය. මැතිවරන කොමසාරිස් මහින්ද දේශප්‍රිය ආන්ඩුව වෙනුවෙන් මැදිහත් වෙමින් මැතිවරනය දක්වා කාලය තුල වෘත්තීය ක්‍රියා වලින් වැලකෙන ලෙස සමිතිවලින් ඉල්ලා සිටියේ ය. ආන්ඩුව විසින් ක්‍රියාවට දැමුනු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කප්පාදු පියවරයන්ට එරෙහිව විදුලිබල, ජල, තෙල්, සෞඛ්‍ය, තැපැල්, වරාය හා වතුකරයේ කම්කරුවන්ගේ අරගල පසුගිය කාලය පුරා පැන නැගුනි. වෘත්තීය සමිති ඒවා යටපත් කලේ අමාරුවෙනි. සිසුන්ගේ හා ගම්බද දුගීන්ගේ විරෝධතා මෙම අරගල සමග සම්පාත විය. ධනපති පක්ෂ නොඅනුමානව මේවා සැලකිල්ලට ගනිමින් අලුත් පෙලගැස්ම සූදානම් කිරීමට උත්සුක වුවා නිසැකය.

මේ පක්ෂ ආර්ථික අර්බුදය නිසා රත්වී සිටියි. මහබැංකුවේ අධිපති ඉන්ද්‍රජිත් කුමාරස්වාමි පෙබරවාරි 15 දා මාධ්‍ය අමතමින් දිග් ඇද්දෙන දේශපාලන අර්බුදය ආර්ථිකය කෙරේ බලපාන බවට අනතුරු ඇඟවූයේ ය. 2019-2022 දක්වා අවුරුද්දකට ඩොලර් බිලියන 3.6 බැගින් නය වාරික ආපසු ගෙවිය යුතුය. ආර්ථික වර්ධනය පහත වැටී තිබේ. ජාත්‍යන්තර පොලී රේට්ටුව අධික වන නිසා විදේශ අරමුදල් පිටට ගලා යනු ඇත. පුද්ගලීකරනය ඇතුලු ආර්ථික ප්‍රතිසංස්කරන වැඩපිලිවෙල නොපිරිහෙලා ක්‍රියාවට දැමිය යුතුය. මහ බැංකු අධිපතිගෙන් ප්‍රකාශයට පත්වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හඬයි.

දේශපාලන අර්බුදය ගැන *සන්ඩේ ටයිම්ස්* ලිපිකරුවෙකු ප්‍රශ්න කල විට රාජපක්ෂ මෙසේ සඳහන් කලේ ය: [තනි ශ්‍රීලනිප] "ආන්ඩුවකට සහයෝගය පල කිරීමේ තීන්දුව ගැනීම මුලුමනින්ම හේතු වූයේ රටට හානි කරන්නා වූ අඳුරු ආර්ථික තත්වයයි."

ධනපති පන්තියේ සියලුම පක්ෂවල බරපතලම කනස්සල්ල නම් ආර්ථික අර්බුදය හා පන්ති අරගලවල පිපිරීමයි.

ලංකාවේ ආර්ථික ගැටලු ලෝක ධනවාදයේ අර්බුදයෙන් උත්සන්න වී තිබේ. පන්ති අරගල ජාත්‍යන්තරව දැන් පැනනගින කම්කරු පන්ති උද්ගමනයේ කොටසකි. අර්බුදයේ බර මහජනයාගේ වියදමින් පියවා ගැනීම හැර වෙනත් විකල්ප ක්‍රියාමාර්ග යක් පාලක පන්තියේ කිසිම කොටසකට නැත. තවත් බර පැටවීමට දරන ඕනෑම ප්‍රයත්නයක් කම්කරුවන්ගේ හා දුගීන්ගේ දැනටමත් කැකෑරෙන විරෝධය ගිනියම්වී පිපිරීමට තුඩු දෙනු ඇත. පාලක පන්තියට තව දුරටත් වෘත්තීය සමිති මත රැඳී කම්කරුවන් පාලනය අපහසුවනු ඇත. වෘත්තීය සමිති තම සේවයට කැඳවාගන්නා ගමන් පොලිස් පාලනයකට මාරු වීමට ආන්ඩුව ද පාලක පන්තියේ අනෙකුත් කන්ඩායම් වල ද සූදානමයි.

ආන්ඩුව බලයට ගෙන ඒමට දරදිය ඇද්ද ව්‍යාජ වාම සංවිධාන හා සිවිල් ක්‍රියාකාරීන්ගේ කන්ඩායම් වත්මන් අර්බුදය තුල දුෂ්ට ක්‍රියා කලාපයක් ඉටු කිරීමට වහා ඉදිරිපත්ව සිටිති. සමාජ සාධාරනත්වය පිලිබඳ වෘත්තීය සමිති ව්‍යාපාරයේ නායකයෙකුවන සමන් රත්නප්‍රිය, පුරවැසි පෙරමුනේ ජනරංජන, ගාමිනි වියන්ගොඩ සහ දඹර අමිල භික්ෂුව ඇතුලු පිරිසක් ජනාධිපති හමුවී ආන්ඩුව දිගටම ගෙනයන ලෙස ඉල්ලා සිටියහ.

පසුව පැවති පුවත්පත් සාකච්චාවකදී දඹර අමිල භික්ෂුව සිරිසේන සමග මොනවා කතා කරන්නට ඇත්දැයි ඉඟි කරමින් ඉල්ලා සිටියේ "ආන්ඩුව පොලීසියට රටේ සාමාන්‍ය නීතියෙන් බැහැරව හා ප්‍රජාතන්ත්‍රවාදී රීතිවලින් පිටස්තරව ක්‍රියා කිරීමට ඉඩ දිය යුතු බවයි. හිටපු හමුදාපති සරත් ෆොන්සේකාට නීතිය තහවුරු කිරීම භාරදී මාස හයක් ඔහු යටතේ රට තැබිය යුතු බව ද මිලිටරිය සීරුවෙන් සිටුවිය යුතු බවද" ඔහු කිවේය.

යෝජනාවන් කර ඇත්තේ දූෂිතයන්ට දඬුවම් පැමිනවීමේ නාමයෙනි. කෙසේ වෙතුදු, මේවා පොලිස් පාලනයක් ඇටවීම සඳහා පාවඩ එලන යෝජනාවන්ය. පාලක පන්තියේ පක්ෂ තිරයට පිටුපසින්, අලුත් පෙලගැසීම් යෝජනා කරමින් සාකච්ජා කරන්නේ කම්කරුවන් හා දුගීන් තලා දමන ඒකාධිපති පාලනයකට මාරුවීමේ මෙම පියවරයන් බවට සමාජවාදී සමානතා පක්ෂය අනතුරු අඟවයි.

© www.wsws.org